# පාරිභෝගික කමිටු

## කළුකඩ වෙළඳාමෙන් පාරිභෝගිකයා ගලවා ගැනීම සඳහා පාරිභෝගික කමිටුව බලගතු ආයුධයක් කරගත හැකිය.

පාරිභෝගික කමිටු මෙරට ජනතා සංවිධාන අතරට අළුතෙන් ම එක් වූවකි. ග්‍රාමීය මට්ටමේ පාරිභෝගික කමිටුවලින් ගැමි ජනතාවට විශාල මෙහෙයක් ඉටු කර ගත හැකි ය. මෙම කමිටු පිහිටුවනු ලබන්නේ 1979 දී නීතිගත කෙරුණු පාරිභෝගික ආරක්ෂක පනතේ පස් වැනි වගන්තියේ විධි විධාන ප්‍රකාර අභ්‍යන්තර වෙළෙඳාම පිළිබඳ දෙපාර්තමේන්තුව මගිනි. මීට වසරකට පමණ පෙර පිහිටුවා ගන්නා ලද 'කැළණිපුර පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ සංගමය' එවැනි සංවිධානයකි.

මෙම කමිටුව පිහිටුවා ගන්නා ලද අවදියේ දී එහි නිලධාරීන් විසින් ප්‍රදේශයේ පාරිභෝගිකයන්ට අවශ්‍ය භාණ්ඩ ලබා ගැනීමට ඇති අවහිරතා ආදිය පිළිබඳව සමීක්ෂණයක් කරන ලදී. පාරිභෝගික භාණ්ඩ බොහොමයක් ම සාධාරණ ලෙස ලබා ගැනීමට අපහසු තත්වයක පවතින බවත්, මිළ පාලනයට යටත්ව විකිණිය යුතු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පවා නියම බරට ලබා ගැනීමට අපහසු බවත්, සමීක්ෂණයේ දී අනාවරණය විය. එදිනෙද ආහාරයට අවශ්‍ය සහල් සමහර වෙළෙඳුන් විසින් හිතු මනාපයට මිළ කර විකුණනු ලැබීමෙන් පාරිභෝගිකයන් විශාල පිරිසකට මුහුණ පෑමට සිදු වන අවහිරතාවයන් ගැන තේරුම් ගත් කමිටුව සිංහාරමුල්ල ප්‍රදේශයට වී අලෙවි මණ්ඩලයේ සහල් අලෙවි මධ්‍යස්ථානයක් ලබා ගැනීමට කටයුතු සැලැස්විය. එම මධ්‍යස්ථානය නිසා සහල් වෙළඳාමෙහි තරඟකාරී තත්ත්වයක් ඇතිවී ප්‍රදේශයේ පාරිභෝගික ජනතාවට සුළුවෙන් හෝ සහනයක් සැලැසිණි.

පාන් සහ තිරිඟු පිටි වලින් නිෂ්පාදිත අනෙකුත් කෑම වර්ග නියමිත බර ප්‍රමාණයන්ට අනුකූලව පිරිසිදු අයුරින් ලබා ගැනීමට පාරිභෝගිකයන්ට අවස්ථාව සළසා දෙන ලෙස ගම්පහ දිස්ත්‍රික්කයේ අභ්‍යන්තර වෙළෙඳම පිළිබඳ නියෝජ්‍ය කොමසාරිස්වරයා ගෙන් ඉල්ලීමක් ද කෙරිණි.

### කළු කඩය මැඩීමට

වෙළෙඳ ව්‍යාපාරයට සම්බන්ධ මෙවැනි සිද්ධීන් එමට තිබේ. දිවයින පුරා වෙළෙඳාම මෙට්‍රික් ක්‍රමයට පරිවර්තනය වීමත් සමඟ ම අවුන්ස 16 පාන් ගෙඩියක් (රාත්තලක්) වෙනුවට පාරිභෝගිකයාට ලැබෙන්නේ ග්‍රෑම් 450 ක පාන් ප්‍රමාණයකි.

පාරිභෝගික ප්‍රශ්නය රටේ පොදු ප්‍රශ්නයක් බවට පත්ව ඇත. දිනෙන් දින වැඩිවන මිළ ගණන් අනුව අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පවා අවශ්‍ය ප්‍රමාණයෙන් සපයා ගැනීමට සුළු වැටුපක් ලබන අයට දුෂ්කර කාර්යයක් වී තිබේ. විවෘත වෙළෙඳ පොලේ නියමිත මිළ මට්ටමක් පවතින්නේ නම් ආදායම අනුව වියදම දැරීමට යම් තරමක හෝ ඉඩ කඩක් පාරිභෝගිකයාට ලැබෙනවාට සැකයක් නැත.

තරඟකාරී වෙළෙඳාමේ දී ඇති වන වෙළෙඳ අක්‍රමිකතා දූෂණ ආදිය අඩු කිරී සඳහා මිළ පාලන ක්‍රියාදාමය මැනිවරණ කොට්ඨාශ මට්ටමින් විමධ්‍යගත කොට, උප දිසාපති කාර්යාලවලට මිළ පාලන නිලධාරියා බැගින් හෝ අනුයුක්ත කර පාරිභෝගික කමිටුවල ද සහාය ඇතිව කටයුතු කිරීම යෙහෙකි. එවැනි පියවරක දී මිළ පාලන නීතිය කඩන වෙළෙඳුන් නීතියේ රැහැනට හසු කර ගැනීමටත්, තරඟකාරී වෙළෙඳාමෙන් පාරිභෝගිකයාට දැනට වඩා සහනයක් සැලසීමට මෙන් ම පාරිභෝජනයට අහිතකර භාණ්ඩ අලෙවිය අවුරාලීමටත් ඉඩකඩ සැලසෙනු ඇත. පාරිභෝගික ද්‍රව්‍ය සාධාරණ අයුරින් පාරිභෝගිකයන්ට ලබා ගැනීම සඳහා පාරිභෝගිකයන් විසින් එකමුතුව පිහිටුවා ගනු ලබන සංවිධානයක් හැටියට 'පාරිභෝගික ආරක්ෂක කමිටු' හැඳින්විය හැකිය.